**NILIS**

# ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

## අධ්‍යක්ෂ තනතුර

කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ (National Institute of Library and Information Sciences - NILIS) අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් / නාමයෝජනා කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් / නම් කරන අය ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 63 ට අඩු විය යුතුය. සාර්ථක අයදුම්කරු / නම් කරන තැනැත්තා පත්වීමේ දිනයේ සිට වසර තුනක කාලයක් හෝ ඔහු / ඇය ඔහුගේ / ඇයගේ වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ යන දෙකෙන් පළමුවෙන්ම එළඹෙන අවස්ථාව තෙක් රාජකාරී කාලය බලාත්මක වනු ඇත.

NILIS යනු කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් වන අතර, එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සහතික, ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි පාඨමාලා පවත්වන ආයතනයකි. NILIS ශිෂ්‍ය ගහනය ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ දැනට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සේවය කරන්නන්ගෙනි. එය පර්යේෂණ හා උපදේශන සේවාවන්හි ද නිරත වේ.

අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක සහ අධ්‍යයන නිලධාරියා වේ. ඔහු / ඇය ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන අතර, ආයතනයේ පාලක මණ්ඩලයේ සහ අධ්‍යයන කමිටුවේ සාමාජිකයෙකි. කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සහ පාලක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යයන නායකත්වය සැපයීමේ වගකීම ඔහු / ඇය දරයි. ඔහු / ඇය ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සඳහා වගකිව යුතු බැවින් අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගවීම, ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය සහ ඵලදායී සහ පක්ෂග්‍රාහී නොවන පරිපාලන නායකත්වය යන මූලධර්ම පිළිගත යුතුය. ආයතනය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම ද අධ්‍යක්ෂවරයා සතුය. ඔහු / ඇය ආයතනයේ සේවාදායකයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් තිබිය යුතු අතර, අරමුදල් උත්පාදනය කිරීමටත්, විශ්වවිද්‍යාල සහ වෙනත් අදාල ආයතන සමග සහයෝගීතාවයන් දියුණු කිරීමටත් ජාත්‍යන්තර සම්බන්ධතාවයන් වර්ධනය කිරීමටත් හැකි විය යුතුය.

අධ්‍යක්ෂවරයා ඔහුගේ / ඇයගේ බුද්ධිමය මෙන්ම කළමනාකරණ දක්ෂතාව තුළින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දක්මක් ඇති පුද්ගලයෙකු විය යුතුය. අයදුම්කරු / නම් කරන තැනැත්තා විශිෂ්ට පර්යේෂණ ප්‍රකාශනයට පත් කර තිබිය යුතු අතර, ඉහළ මට්ටමේ අන්තර් පුද්ගල කුසලතා සහිත නායකත්ව ගුණාංග සහ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති, අධ්‍යාපනික වශයෙන් ඉහළ හා අවංක පුද්ගලයකු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අධ්‍යක්ෂවරයාට මහාචාර්යවරයකුට හිමි වැටුපක් සහ තනතුරට අදාල වෙනත් දීමනා ලැබෙනු ඇත.

**අයදුම්පත් / නාමයෝජනා සමග පහත සඳහන් ලේඛන තිබිය යුතුය.**

(i) උපන්දිනය ඇතුළුව අයදුම්කරුගේ / නම් කළ අයගේ සම්පූර්ණ ජීව දත්ත සටහනක් (උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් අමුණා තිබිය යුතුය)

(ii) අධ්‍යයන හා පර්යේෂණ විශිෂ්ටත්වය, වෘත්තීය සන්නිවේදනය සහ කළමනාකරණ නිපුණතාවය, ඵලදායී නායකත්වය ආදිය සඳහා අදාල සාක්ෂ්‍යවල පිටපත්

(iii) ආයතනයේ සංවර්ධනය පිළිබඳ දැක්මේ ප්‍රකාශයක්

(iv) අධ්‍යක්ෂ තනතුරට පත් කරනු ලැබුවහොත් ඔහු / ඇය අත්කර ගැනීමට අපේක්ෂිත අරමුණු සඳහා යෝජනා ඇතුළත් කෙටි විස්තරයක්

(v) නාමයෝජනාවක් නම්, එසේ නම් කරන ලද තැනැත්තාගේ කැමැත්ත ඇතුළත් ලිපියක්

(vi) NILIS ආයතනයේ හැර, වෙනත් රාජ්‍ය අංශයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු / නම් කරන ලද අයෙකු නම්, ඔහු / ඇය තනතුරට පත් කළහොත් ඔහු / ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන්න සඳහන් සේවායෝජකයා විසින් ලබාදුන් ලිපියක්.

සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයින් පෞද්ගලිකව කැඳවනු ලැබේ. සුවිශේෂී අවස්ථාවක, අපේක්ෂකයෙකුට පෞද්ගලිකව පෙනී සිටීමට හැකියාවක් නොමැති නම්, ඔහුට / ඇයට වීඩියෝ සම්මන්ත්‍රණ හෝ ස්කයිප් හරහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. අපේක්ෂකයෙකු අවම වශයෙන් විනාඩි දහය (10) ක, නමුත් විනාඩි පහළොව (15) නොඉක්මවන කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් විය යුතුය. සම්මුඛ සාකච්ඡා 2020 සැප්තැම්බර් 11 දිනැති UGC චක්‍රලේඛ අංක 07/2020 හි ඇමුණුම 1 හි දක්වා ඇති ලකුණු පත්‍රයේ දක්වා ඇති නිර්ණායක වලට අනුව පැවැත්වෙන අතර, එය https://nilis.cmb.ac.lk/wp-content/uploads/2020/10/2221_commission-Circular-No-07-2020-English.pdf වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ UGC වෙබ් අඩවියෙන් (https://www.ugc.ac.lk) ලබාගත හැකිය.

අයදුම්පත් / නාමයෝජනා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ – 03, වෙත මුද්‍රා තැබූ කවරයක / ලියුම් කවරයක යොමු කළ යුතු අතර, 2020 නොවැම්බර් 23 ප.ව. 3.00 ට හෝ ඊට පෙර ඉහත කාර්යාලයට පැමිණ භාර දී හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ එවිය යුතුය. අයදුම්පත / නාමයෝජනා ඇතුළත් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"අධ්‍යක්ෂ තනතුර"** ලෙස සටහන් කළ යුතුය.

අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් / නාමයෝජනා ප්‍රතික්ෂේප කෙරේ.

**කළමනාකරණ මණ්ඩලයේ ලේකම්,**
**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය.**
**2020.10.22**